රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 40/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1988 නොවැම්බර් මස 15 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානියන් වෙත.

## රාජ්‍ය සේවයේ නැවත සේවයේ යෙදවීමේ දී පාරිශ්‍රමිකය.

රාජ්‍ය සේවයේ නැවත සේවයේ යෙදවූ පුද්ගලයකුගේ පාරිශ්‍රමිකය 1988.01.01 දින පසු පහත සඳහන් පරිදි විය යුතුය.

(I) සේවයේ කඩවීමක් ඇතිව හෝ නැතිව හෝ නැවත සේවයේ යෙදවූ අයෙකුට, ඔහු රාජ්‍ය සේවයේ යෙදී සිටියදී අන්තිමට ලත් වැටුප, නැවත සේවයේ යොදවන අවස්ථාවේදී පවතින අදාළ වැටුප් පරිමාණය අනුව නිසි වැටුප් තලයට පරිවර්තනය කිරීමට යටත්ව, ගෙවිය යුතුය.

(II) යම් අයෙකු තවත් කාල සීමාවකට නැවත සේවයේ යෙදවූ විට, ඒ එක් එක් වර්ෂය වෙනුවෙන් ඔහු සේවයේ යෙදී සිටියේ නම් ගෙවිය හැකිව තිබූ, එවකට අදාළ වන වැටුප් පරිමාණය අනුව පරිවර්තනය කරන ලද එක් වැටුප් වර්ධකයක අගය ඔහු නැවත සේවයේ යොදවා සිටි ඉකුත් වර්ෂයේ වැටුපට එකතු කර ගෙවිය යුතුය.

(III) වැටුප් සම්බන්ධයෙන් ඉහත දැක්වූ කරුණු අදාළ කරගත නොහැකි අවස්ථාවක් වේ නම්, නැවත සේවයේ යෙදවීම අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශයට යෝජිත වැටුප ඇතුළත් කිරීමට ප්‍රථම, ආයතන අධ්‍යක්ෂ විමසිය යුතුය.

02. රාජ්‍ය සේවයේ නැවත සේවයේ යොදවන සියලුම ශ්‍රේණිවල නිලධාරීන්ට මෙම විධිවිධාන අදාළ වේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය